(නවවැනි පාර්ලිමේන්තුව - සිව්වැනි සභාවාරය)

අංක 1(15).]

# පාර්ලිමේන්තුවේ අංක 1 දරන

# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2023 මැයි 31 බදාදා**

---

**2023 ජුනි 08 බ්‍රහස්පතින්දා**

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— "2019 නොවැම්බර් සිට මේ දක්වා රටේ ආර්ථිකයේ පසුබෑම පිළිබඳ සොයා බලා වාර්තා කිරීමටත්, ඒ පිළිබඳව සිය යෝජනා හා නිර්දේශ ඉදිරිපත් කිරීමටත් වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව" ස්ථාපිත කිරීම පිණිස වූ යෝජනා සම්මතය සඳහා සංශෝධනය,— 2023 මැයි 26 දින පැවැති පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී එළැඹි තීරණය පරිදි, 2023 ජනවාරි 19 දින පාර්ලිමේන්තුව විසින් යථා පරිදි සම්මත කරන ලද යෝජනාව මතු සඳහන් පරිදි සංශෝධනය කළ යුතු ය:—

නාමය :

නාමය ඉවත් කර ඒ වෙනුවට මතු සඳහන් කොටස ආදේශ කළ යුතු ය:—

"රජය විසින් ප්‍රකාශයට පත් කළ මූල්‍ය බංකොලොත්භාවයට හේතු පරීක්ෂා කර පාර්ලිමේන්තුවට වාර්තා කිරීමටත්, ඒ පිළිබඳව සිය යෝජනා හා නිර්දේශ ඉදිරිපත් කිරීමටත් වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව";

1 කොටස :

දෙවැනි ඡේදය ඉවත් කර ඒ වෙනුවට මතු සඳහන් කොටස ආදේශ කළ යුතුය:—

"මුදල් හා ආර්ථික කටයුතු භාර බලධාරීන් හෝ අමාත්‍ය මණ්ඩලය විසින් සිතා මතා මෙම ආර්ථික අපරාධය සිදු කළා ද යන්න පිළිබඳව විමර්ශනය කිරීම පාර්ලිමේන්තුවේ වගකීම වන හෙයින්;සහ"

තුන්වැනි ඡේදය ඉවත් කර ඒ වෙනුවට මතු සඳහන් කොටස ආදේශ කළ යුතුය:—

"බදු සහන ලබා දීම, ණය වාරික නොගෙවා සිටීම, ආනයන සීමා පැනවීම, රුපියල සීඝ්‍ර ලෙස අවප්‍රමාණය වීමට ඉඩ සැලසීම, නිල සංක්‍රමණික ප්‍රේෂණ පහත වැටීම, රටේ උද්ධමනය අධි උද්ධමන තත්ත්වයක් දක්වා වැඩිවීම සහ ජීවන වියදම වැඩිවීම වැනි සාධක මෙරට මූල්‍ය බංකොලොත්භාවයට හේතු වූ හෙයින් ද;"

තුන්වැනි ඡේදයේ (අ) කොටස ඉවත් කර ඒ වෙනුවට මතු සඳහන් කොටස ආදේශ කළ යුතුය:—

"(අ) මෙතෙක් මුහුණ නොදුන් ආර්ථික අර්බුදයකට සහ මූල්‍ය බංකොලොත් භාවයකට රටට මුහුණ දීමට සිදු වූයේ, ඒ සම්බන්ධයෙන් වගකීම් දරන ලද පුද්ගලයන් තම කාර්යභාරය නිසි පරිදි ඉටු කිරීමට අපොහොසත් වීම හේතුවෙන් ද යන්නත්;"

තුන්වැනි ඡේදයේ (ආ) කොටස ඉවත් කර ඒ වෙනුවට මතු සඳහන් කොටස ආදේශ කළ යුතුය:—

"(ආ) එම මූල්‍ය බංකොලොත්භාවය වැළැක්වීමට අදාළ බලධාරීන් ප්‍රමාණවත් පියවර ගත්තේ ද යන්නත්;"

තුන්වැනි ඡේදයේ (ඇ) කොටස ඉවත් කර ඒ වෙනුවට මතු සඳහන් කොටස ආදේශ කළ යුතුය:—

"(ඇ) එවැනි ආර්ථික අර්බුදයකට සහ මූල්‍ය බංකොලොත්භාවයකට මුහුණ දීමට දායක වූ වෙනත් කරුණු තිබේ ද යන්නත්;"

තුන්වැනි ඡේදයේ (ඉ) කොටස ඉවත් කර ඒ වෙනුවට මතු සඳහන් කොටස ආදේශ කළ යුතුය:—

"(ඉ) අනාගතයේදී රට එවැනි ආර්ථික අර්බුදයකට සහ මූල්‍ය බංකොලොත්භාවයකට පත්වීමට දායක වන්නා වූ වෙනත් කරුණු තිබේ ද යන්න; සහ"

"2023 ජනවාරි 19 දින පාර්ලිමේන්තුව විසින් යථා පරිදි සම්මත කරන ලද යෝජනාවෙහි ඉහතින් සංශෝධනය වූ කොටස් හැර අනෙකුත් කොටස් තවදුරටත් නොවෙනස්ව පවතී"